**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 202-8500 ● ෆැක්ස්: +94 (11) 202-8621
විද්‍යුත් තැපෑල: BickelCE@state.gov ● වෙබ්: http://lk.usembassy.gov

**ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එ.ජ. නියෝජිත ආයතනය (USAID) - සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පීඑල්සී හවුල්කාරිත්වය ශ්‍රී ලංකාවේ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාර වලට පුරෝගාමී වෙයි**

2023 ඔක්තෝබර් 25 වැනි දින ශ්‍රී ලංකාවේ කොළඹදී – ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එ.ජ. නියෝජිතායතනයේ සාගර ප්ලාස්ටික් අඩු කිරීමේ ක්‍රියාකාරකම හරහා එක්සත් ජනපදය ද, සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පීඑල්සී (CCS) හි ගුණදමින් එලිෆන්ට් හවුස් ද, අවබෝධතා ගිවිසුමක් හරහා ඔවුන්ගේ සන්ධානය ශක්තිමත් කරගෙන ඇත. මෙම සහයෝගීතාවය හරහා කසල වෙන් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය පිරිසැකසුම කෙරෙහි අවධාරණය කරමින්, කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන, ශ්‍රී ලංකාවේ පළමු ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ප්ලාස්ටික් රැස් කිරීමේ ජාලය සහ ද්‍රව්‍ය ප්‍රතිසාධන කම්හල (MRF) පිහිටවීමට අරමුණු කරයි.

සෝබා කාන්තා පාරිසරික කළමනාකරණ සහ ප්‍රජා සංවර්ධන පදනමේ හා ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණයේ ප්‍රමුඛයකු වන ඩිරිඩිස් ප්‍රයිවට් ලිමිටඩ් හි සහය ඇතිව මුලින්ම මාතර දික්වැල්ලේ දී දියත් කරනු ලැබූ මෙම හවුල්කාරිත්වය දැනටමත් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,175 ක් රැස් කර තිබේ. ඉදිරියට, බිම් මට්ටමේ කාන්තා සංවිධාන සමඟ හවුල්කාරිත්වයෙන් වෙරළබඩ පළාත් පහකට මෙම ව්‍යාපාරයේ විෂයපථය පුළුල් කිරීමට සැලසුම් කර තිබේ. මෙම හවුල්කාරිත්වයන් හරහා ඉලක්ක කරන්නේ, ධීවර ප්‍රජාවන්හි සිටින ආර්ථික වශයෙන් අවාසිසහගත තත්ත්වයේ පසුවන කාන්තාවන් හඳුනාගෙන ඔවුන්ව සවිබල ගන්වා සක්‍රිය ප්ලාස්ටික් රැස් කරන්නියන් හා පාරිසරික භාරකරුවන් බවට පරිවර්තනය කිරීමයි.

USAID ශ්‍රී ලංකා සහ මාලදිවයින් දූතමණ්ඩල ආර්ථික වර්ධන කාර්යාලයේ අධ්‍යක්ෂ ක්‍රිස්ටෝෆර් පවර්ස් අදහස් දක්වමින් “ශ්‍රී ලංකාව සමඟ දීර්ඝ කාලයක් තිස්සේ පවතින සිය සබඳතාව හරහා එක්සත් ජනපදය, පරිවර්තනයක් ඇතිකිරීම සඳහා සහයෝගීතාවයට ඇති බලය පිළිබඳව විශ්වාස කරනවා,” යනුවෙන් ප්‍රකාශ කළේය. “වෙනසට පෙරමුණ ගැනීමේදී හුදෙක් පාරිසරික සංරක්ෂණයට පමණක් නොව කාන්තාවන්ගේ භූමිකාවන්ද ප්‍රවර්ධනය කිරිමට ප්‍රතිඥා දෙන මෙම හවුල්කාරිත්වය ඒ විශ්වාසය පිළිබිඹු කරන්නක්."

සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් වෙනුවෙන් ජෝන් කීල්ස් හෝල්ඩිංස්හි පාරිභෝගික ආහාර අංශයේ සභාපති දමින්ද ගම්ලත් අදහස් දක්වමින්, "වගකීම් සහගත ප්ලාස්ටික් බැහැරකිරීමේ සහ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ව්‍යාපාර වෙනුවෙන් ගුණදමින් එලිෆන්ට් හවුස්හි නොසැලෙන කැපවීම ප්‍රජාව තුළ පිළිගැනීමක් අත්කර ගෙන තිබෙනවා. මෙම දුර දක්නා හවුල්කාරිත්වය හරහා අපගේ අරමුණ වන්නේ ප්ලාස්ටික් රැස් කිරීමේ අපගේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම පමණක් නොව ඔරොත්තු දෙන සහ පාරිසරික දැනුවත්බව සහිත ශ්‍රී ලංකාවක් පෝෂණය කරමින් කාන්තාවන් සවිබල ගැන්වීමද සිදු කිරීමයි. තිරසාරබව සහ කාන්තාවන් සවිබල ගැන්වීම එකට එක් වූ විට ධනාත්මක වෙනසක් ඇති කිරීමේ හැකියාවට උදාහරණ සපයන සුවිශේෂී හා ශක්තිමත් සහජීවනයක් මෙම සහයෝගිත්වයෙන් නියෝජනය කරනවා." යනුවෙන් පැවසීය.

මෙම ව්‍යාපාරයේ කොටසක් ලෙස, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය රැස්කරන්නියන් වීමට හැකියාව ඇතැයි හඳුනාගත් කාන්තාවන්ට ලාභදායක ප්‍රතිචක්‍රීකරණ හැකියාව සහිත ප්ලාස්ටික් සහ ලෝහ යන නිශ්චිත අපද්‍රව්‍ය වර්ග ආරක්ෂා සහිතව රැස් කිරීමට පුහුණුව සහ අවශ්‍ය උපකරණ සැපයීම සිදු කෙරේ. සාගර ප්ලාස්ටික් අඩුකිරීමේ ක්‍රියාකාරකම, ගුණදමින් එලිෆන්ට් හවුස් සහ විරිඩිස් යන ආයතන වල සහාය ඇතිව, අත් වැසුම්, තරාදි සහ රැස් කිරීමේ බෑග් වැනි අත්‍යවශ්‍ය මෙවලම් මෙම කාන්තාවන්ට සපයනු ලැබේ. ඉන්පසු බිම් මට්ටමේ සංවිධාන ඔවුන්ගේ විශේෂිත රැස් කිරීම් මධ්‍යස්ථානවලදී රැස් කළ අපද්‍රව්‍ය භාර ගනී.

වටිනා ප්ලාස්ටික් සහ ලෝහ අපද්‍රව්‍ය කාර්යක්ෂම ලෙස පිරිසැකසුම් කෙරෙන බවට වග බලා ගනිමින් විරිඩිස් ආයතනය ප්‍රතිචක්‍රීකරණ අදියරේදී වගකීම උසුලයි. කාන්තාවන්ගේ දායකත්වය වෙනුවෙන්, ඔවුනට ගෙවීම් ලැබේ. මෙම ආකෘතිය, චක්‍රීය ආර්ථිකයට නිදසුනකි. පරිසර දූෂණය සැලකිය යුතු ලෙස අඩු කරමින්, පරිභෝජනය කරන ලද ප්ලාස්ටික් සහ ලෝහ යළි අගය දාමය තුළට හඳුන්වා දෙනු ලබන අතර එමගින් එම චක්‍රය සම්පූර්ණ කරමින් ශ්‍රී ලංකාව චක්‍රීය ආර්ථිකයකට තවත් පියවරකින් සමීප කරවීම මෙයින් සිදු වේ. මෙම පාරිසරික ප්‍රතිලාභවලට අමතරව, මෙම කාන්තාවන්ගේ ඉපයීම් සෘජුවම ඔවුන්ගේ පවුල්වලට සහ වඩා පුළුල් ප්‍රජාවට ප්‍රතිලාභ අත්කර දෙන බැවින් මෙම ව්‍යාපාරය දේශීය ආර්ථිකය ද ශක්තිමත් කරයි. තවද ඔවුන්ගේ සක්‍රිය සම්බන්ධවීම තුළින් මෙම කාන්තාවෝ ඔවුන් වෙසෙන ප්‍රදේශ තුළ පරිසරය පිළිබඳ දැනුවත්බව ප්‍රවර්ධනය කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරති.

මෙම සහයෝගිත්වයෙහි හරය ගත් කළ එය ප්ලාස්ටික් එකතු කිරීමට වැඩි යමක් නියෝජනය කරයි; එය තිරසාර ආර්ථිකයන් කරා උපායමාර්ගික විතැන්වීමක් වන අතරම ඓතිහාසික වශයෙන් කාන්තාවන්ව කොන් කරනු ලැබූ අංශවල කාන්තාවන් ස්ථානගත කිරීමේ දැනුවත්  ප්‍රයත්නයක් වේ. එය අත්‍යවශ්‍යව පවතින ප්‍රජාවන් තුළ, ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ කාන්තාවන් සවිබල ගැන්වීමේ මාර්ග මේ හරහා ඇතිකරයි.

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එ.ජ. නියෝජිත ආයතනයේ (USAID) සාගර ප්ලාස්ටික් අඩුකිරීමේ ක්‍රියාකාරකම එහි පස් අවුරුදු ඉලක්කය සමඟ ශ්‍රී ලංකාව සහ මාලදිවයින යන දෙරටේම පාරිසරික ප්ලාස්ටික් අඩු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාර පුළුල් කිරීම වෙනුවෙන් දැඩි ලෙස කැපවී සිටී. USAID හි වඩා පුළුල් මෙහෙවර වන සමාජ ආර්ථික සවිබල ගැන්වීම සිදුකරන අතර ම පාරිසරික භාරකාරීත්වය ප්‍රවර්ධනය කිරීම මෙම සහයෝගීත්වයෙන් සංකේතවත් කරයි.

වසර 150 ක උරුමයක් සමඟ, එහි විශ්වසනීයත්වය සහ සමාජ අභිවෘද්ධියට කැපවීම සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රසිද්ධිය සහිත එලිෆන්ට් හවුස්,  ශ්‍රී ලාංකික සිත් තුළ ගැඹුරින් කාවැදුණු  ආදරය දිනූ සන්නාමයකි. ගුණදමින් එලිෆන්ට් හවුස්, සමාජ අභිවෘද්ධිය වෙනුවෙන් සැලසුම් කරන ලද ව්‍යාපාර රැසකට කැප වූ එලිෆන්ට් හවුස් හි ආයතනික සමාජ වගකීම් හස්තය වේ. මෙම ව්‍යාපෘතිය, තිරසාර සහ වගකීම් සහිත පිළිවෙත් කරා යොමුවීම සඳහා ගුණදමින් එලිෆන්ට් හවුස් අනුගමනය කරන පරිපූර්ණ ප්‍රවේශය සමන්විත වන ප්‍රජා සහ තිරසාර අත්කර ගැනීම් ප්‍රතිපත්ති සමඟ එක්වන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය යටතට ඇතුළත් වේ.